## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

### පළාත් පාලන ඡන්ද විමසීම 2018

### පොලිස් නිලධාරින් සඳහා වූ මාර්ගෝපදේශ

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතින්ට අනුව හා 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව ජනතාව සතු ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතියත්, දේශපාලන කටයුතු වල නිදහසේ නිරතවීමේ අයිතියත්, නිදහස් හා සාධාරණ මැතිවරණයකට ඇති අයිතියත් තහවුරු කර ඇති බව පිළිගනී. කොමිෂන් සභාවේ එම පිළිගැනීම අනුව ඊට අදාළව ඡන්දය පැවැත්වෙන දිනය දක්වාත්, ඡන්දය පැවැත්වෙන දිනයේදීත්, ඡන්දය අවසන් වූ කාලසීමාවේදීත් පහත සඳහන් මාර්ගෝපදේශයන් සියලුම පොලිස් නිලධාරින් විසින් පිළිපැදිය යුතු වේ.

(අ) මැතිවරණයට පෙර මැතිවරණ දිනයේ හා ඉන් පසු සිදුවන මැතිවරණ හිංසනයන් පිළිබඳ පැමිණිලි භාර ගැනිමත්, විමර්ශනය කිරිමත් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව ප්‍රකාරව කළ යුතුය. එම වගන්තිය මගින්, සියලුම පුද්ගලයන් නීතිය ඉදිරියේ සමාන බවත්, නීතියේ සම රැකවරණය ලැබීමට සියලුම පුද්ගලයන්ට මුලික අයිතියක් ඇති බවත් පිළිගනී. යම් පැමිණිල්ලක් සම්බන්ධව අදාළ ක්‍රියා මාර්ග නොගැනීමක් හෝ පැහැර හැරීමක් හෝ මග හැරීමක් වේ නම් මුලික අයිතිවාසිකමක් කඩ කිරීම සම්බන්ධයෙන් පොලීසිය වගකිමට යටත්වනු ඇත.

(ආ) මෙම පැමිණිලි සම්බන්ධ විමර්ශන පක්ෂග්‍රාහි නොවන ආකාරයෙන් ක්‍රියාත්මක කළ යුතුය. දේශපාලන බලපෑම් හේතුවෙන් හෝ වෙනත් පිළිනොගත හැකි හේතුවක් නිසා මේ පිළිබඳ වූ පැහැර හැරීම් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව උල්ලංඝනයක් ලෙස සැලකේ.

(ඇ) මැතිවරණ ප්‍රචාරය හා සම්බන්ධ නීති සර්ව සාධාරණව සියලුම පුද්ගලයන් වෙනුවෙන් ක්‍රියාත්මක කල යුතුය. සියලු දේශපාලන පක්ෂ, ස්වාධින කණ්ඩායම් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) ප්‍රකාරව සමානව සැළකිය යුතුය. එනම් "කිසියම් පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය දේශපාලන මතය හෝ උපන් ස්ථානය" යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොවිය යුත්තේ ය. විශේෂයෙන් දේශපාලන මතය හේතුවෙන් අසමානව සැළකීම හෝ වෙනස්කොට සැළකීම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යාවස්ථාව උල්ලංඝනය කිරීමකි.

(ඈ) ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා අවර පත්‍ර ලබාදීමත්, මැතිවරණ රැස්වීම් පැවැත්වීමත් 1981 අංක 15 දරණ ජනාධිපතිවරණ සහ 1981 අංක 01 දරණ පාර්ලිමේන්තු මහා මැතිවරණ යන පනත්වල 68(2) ව්‍යවස්ථාව අනුව මෙම වගකීම ඉටු නොකිරීම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමකි.

(ඉ) මැතිවරණ සමයේ පැවැත්වෙන පෙළපාලි සඳහා අවසර ලබාදීම පළාත් පාලන මැතිවරණ ආඥා පනතේ 81 අ (2අ) වගන්තියට අනුකූල විය යුතුය. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 හා 14 ව්‍යවස්ථා ප්‍රකාරව ලබාදිය යුතු, විශේෂයෙන්ම 14(1) වැනි ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති භාෂණයේ නිදහස, සාමකාමී රැස්වීමේ නිදහස, සමාගමයේ නිදහස හා එහා මෙහා යෑමේ නිදහසට අනුකූල විය යුතු වේ.

(ඊ) අත් පත්‍රිකා, පෝස්ටර්, අපේක්ෂකයන්ගේ ඡායාරූප, සංකේත, කොඩි සහ බැනර් ප්‍රදර්ශනය කිරීම මැතිවරණ නීතිය අනුව විය යුතුය. යම්කිසි පක්ෂයකට හෝ කණ්ඩායමකට විශේෂ සැළකිලි දැක්වීම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමකි.

(උ) ඡන්දය භාවිතා කිරීමේ අයිතිය උල්ලංඝනය කරන පුද්ගලයන් සම්බන්ධයෙන් පොලීසිය දැඩිව නීතිය ක්‍රියාත්මක කළ යුතුය. මෙ ක්‍රියාමාර්ග අනුගමනය නොකරන්නේ නම් ඉහත දැක්වූ පරිදි එය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 හා 14 (1) ව්‍යවස්ථා උල්ලංඝනය කිරීමකි.

(ඌ) අන් අයගේ ඡන්ද පොලවල් සහ සෙසු ස්ථාන සඳහා පොලිස් නිලධාරීන් ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබාදිය යුතු අතර, රටේ පවතින නීතීන් අනුගමනය කරමින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා සියළුම උත්සාහයන් දැරිය යුතු ය.

(එ) දේශපාලන පක්ෂ හෝ පුද්ගලයින් මැතිවරණ නීති උල්ලංඝනය කරයි නම් ඔවුන්ගේ තත්වය හෝ දේශපාලන බලය නොතකා නීතිය ඔවුන් කෙරෙහි සමානව ක්‍රියාත්මක කළ යුතුය. රජයේ වාහන, ගොඩනැගිලි හා ස්ථාන වැනි පොදු දේපලවලට හානි කරන හෝ අයුතු ලෙස පරිහරණය කරන පුදුගලයින්ට එරෙහිව දැඩි ලෙස නීතිය ක්‍රියාත්මක කිරීම පොලිස් නිලධාරියාගේ රාජකාරීමය වගකීම වන්නේ ය.

(ඒ) පශ්චාත් මැතිවරණ හිංසනයන් ඇතිළු මැතිවරණය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වයන් වැළකීම පොලීසිය සතු වගකීමකි. පසුගිය අත්දැකීම් අනුව දේශපාලන බලය මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය වන අන්දමේ මැතිවරණ හිංසනයන් සඳහා යොදා ගන්නා බව පෙනේ. මේ හේතුවෙන් පොලීසිය නීතියෙන් නියම කර ඇති විධිවිධානයන් ප්‍රකාරව මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් වැළැක්වීමට අවශ්‍ය සියළු පියවරයන් ගත යුතුය.

(ඔ) පොලීසියේ මූලිකත්වය මත හෝ වෙනත් පාර්ශවයන්ගේ පෙළඹවීම මත පුද්ගලයන් වධහිංසා හෝ කෲර, අමානුෂික, අවමන් සහගත සැළකිල්ලට හෝ නැතහොත් දඬුවමකට යටත් කිරීම ඇතුළුව කිසිදු ආකාරයක හිංසනයකට පොලීසිය භාජනය නොවිය යුතු ය.

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka

ආචාර්ය දීපිකා උඩගම,

සභාපතිනී,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

2018 ජනවාරි 16